පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

පුරවැසි අධ්‍යාපනය දෙවන වාර අවසාන ඇගයීම

සතිය _ 27

ශ්‍රේණිය : 6

සකස් කිරීම _ මාවනැල්ල කලාපයල

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**1 සිට 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

I කොටස

(01) පාසල් සංවිධාන ව්‍යුහයට අයත් නොවන කමිටුවකි.

(1) විනය කමිටුව
(2) ක්‍රීඩා කමිටුව
(3) සුබසාධන කමිටුව
(4) ආරක්ෂක කමිටුව

(02) ඔබ පාසලට ඇතුළත් වූ දිනය නිවැරදි බව තහවුරු කර ගත් ආකාරය වන්නේ,

(1) තම මවගෙන්
(2) නාම ලේඛනයෙන්
(3) සිසුන් ඇතුළත් කිරීමේ ලේඛනයෙන්
(4) පන්ති භාර ගුරුතුමිගෙන්

(03) ශ්‍රී ලංකාවේ මුල් ම අධ්‍යාපන අමාත්‍යවරයා වන්නේ,

(1) සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා
(2) ආතර් වී දියෙස් මහතා
(3) ඩී. එස්. සේනානායක මහතා
(4) එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා

(04) සැලසුම්කරණය හා සංවිධානය නිසා අත්වන වාසියක් වන්නේ,

(1) සම්පත් පිරිමැස්ම
(2) කාලය වැය වීම.
(3) සිතේ පීඩාකාරී බව මතු වීම.
(4) ගැටලු ඉස්මතු වීම.

(05) සම්පත් අතරින් ස්වාභාවික සම්පතක් ලෙස හඳුනා ගත හැක්කේ,

(1) ගොඩනැගිලි
(2) මං මාවත්
(3) භූමිය
(4) යාන වාහන

අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා තිත් ඉර මත ලියන්න.

(06) ඕනෑම අයෙකුට ජීවිත කාලය තුළ දී ...................................................... මුහුණ දීමට සිදු වේ. (අභියෝගවලට/දිළිඳු බවට)

(07) ශ්‍රී ලංකාවේ පළාත් ............................................... ක් ඇත. (7/9)

(08) අපේ රටේ කුඩා ම පරිපාලන කොට්ඨාසය වනුයේ............................................. කොට්ඨාසයයි. (මැතිවරණ/ග්‍රාම නිලධාරී)

(09) භෞතික සම්පත් ප්‍රධාන කොටස්.....................................ට බෙදේ. (3/2)

(10) මහ නගර සභාවක ප්‍රධානියා වන්නේ.............................ය. (නගරාධිපති/ සභාපති)

අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් ✓ ලකුණ ද වැරදි නම් × ලකුණ ද වරහන තුළ යොදන්න.

(11) හැඳුනුම්පත් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු කරන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයයි. (.................)

(12) ඔබට සමාන කිසිවෙකු මෙලොව නැත. (.................)

(13) ඔබ ජීවත්වන දිස්ත්‍රික්කය අයත් වන්නේ සබරගමු පළාතටයි. (.................)

(14) මිනිසා උපතින් ම විවිධ හැකියාවලින් යුක්ත නොවේ. (.................)

(15) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන තුනක් දක්නට ලැබේ. (.................)

අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තිත් ඉර මත ලියන්න.

(16) නොකළ යුතු බවට සම්මතයේ ඇති කොන්දේසි සියල්ල ...........................................................වේ.

(17) පාංශු සංරක්ෂණය සඳහා ........................................................ කළ හැකිය.

(18) ශ්‍රී ලංකාවේ වැඩි ම දිස්ත්‍රික්ක ගණනක් ඇති පළාත වන්නේ ............................................................. පළාතයි.

(19) ළමුන් සඳහා ළමා අයිතිවාසිකම් මෙන් ම ....................................................................... ද ඇත.

(20) අධ්‍යාපන කටයුතුවල නියමුවා ලෙස කටයුතු කිරීම ........................................................ ගේ කාර්යභාරයයි.

(ලකුණු 2 x 20 = 40)

## 11 කොටස

පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.

(01) (1) ඔබ ප්‍රදේශයේ ජනතාව අවශ්‍යතා ඉටු කර ගැනීමට පිහිටුවා ගත් සමිති දෙකක් නම් කරන්න.

(2) සාමූහිකව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

(3) ඔබේ පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු දැනගත හැකි මූලාශ්‍ර දෙකක් ලියන්න.

(4) සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා සිදු කළ සේවාවන් දෙකක් ලියන්න.

(5) ශ්‍රී ලංකාව පිළිබඳ වාක්‍ය දෙකක් ලියන්න.

(6) ශ්‍රී ලංකාවේ පළාත් ගණන හා පරිපාලන දිස්ත්‍රික්ක ගණන පිළිවෙළින් ලියන්න.

(7) හිරු එළියෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

(8) ආගමික සිද්ධස්ථානයකින් සිදුවන සේවා දෙකක් ලියන්න. (ලකුණු 2 x 8 =16)

(02) (1) ඔබේ පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත දෙකක් ලියන්න. (ලකුණු 2)

(2) පාසල් පරිසරය තුළ ඔබේ අධ්‍යාපන කටයුතුවලට සහයෝගය ලබාදෙන හතර දෙනෙක් නම් කරන්න. (ලකුණු 4)

(3) පාසල් සිසුවකු ලෙස ඔබගෙන් පාසලට ඉටුවිය යුතු යුතුකම් තුනක් සඳහන් කර, එසේ යුතුකම් ඉටු කිරීම නිසා පාසලට සිදුවන සේවය පිළිබඳ කරුණු දෙකක් ලියන්න. (ලකුණු 5)

(03) (1) ඔබ ජීවත්වන පළාතට ආසන්න පළාත් දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(2) ඔබ ජීවත්වන ප්‍රදේශයේ දක්නට ලැබෙන ස්වාභාවික සම්පත් හතරක් නම් කරන්න. (ලකුණු 4)

(3) ඔබ ප්‍රදේශයේ වෘක්ෂලතා වර්ග තුනක් නම් කර එම ශාකවල දක්නට ලැබෙන විශේෂිත ලක්ෂණ දෙකක් ලියන්න.

(ලකුණු 5)

(04) (1) යහපත් පුද්ගලයෙකු වීමට ඔබ විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 2)

(2) ජීව දත්ත පත්‍රිකාවක තිබිය යුතු අනිවාර්ය තොරතුරු හතරක් ලියන්න. (ලකුණු 4)

(3) අන් අයගෙන් ප්‍රශංසා ලබන විට ඔබට දැනුණු හැඟීම් තුනක් දක්වා දැනට ඔබ සතුව ඇති එහෙත් අත්හළ යුතු දුර්වලතා දෙකක් ලියන්න. (ලකුණු 5)

(05) (1) අපේ දිවි පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය ස්වාභාවික සම්පත් දෙකක් ලියන්න. (ලකුණු 2)

(2) මිනිසා විසින් නිර්මාණය කරන ලද සම්පත් හතරක් නම් කරන්න. (ලකුණු 4)

(3) ඔබ ප්‍රදේශයේ මිනිසුන් සාමුහික ව කටයුතු කරන අවස්ථා තුනක් සඳහන් කර සාමුහිකව කටයුතු කිරීමෙන් අත්වන වාසි දෙකක් ලියන්න. (ලකුණු 5)

(06) (1) ඔබේ අවශ්‍යතා ඉටුකර ගැනීමට උදව් වන රාජ්‍ය ආයතන දෙකක් නම් සඳහන් කරන්න. (ලකුණු 2)

(2) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඉටුකර ගත හැකි සේවාවන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)

(3) ලංකාවේ මහ නගර සභා තුනක් නම් කර ඉන් ඉටුවන සේවා දෙකක් ලියන්න. (ලකුණු 5)

(07) (1) සිසුවෙක් ලෙස ඔබට ඇති අයිතිවාසිකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(2) රජය විසින් ඔබට සපයා ඇති පහසුකම් හතරක් ලියන්න. (ලකුණු 4)

(3) පාසලෙන් සමාජයට සැපයෙන සේවා තුනක් සඳහන් කර පාසලේ දියුණුවට කටයුතු කරන කණ්ඩායම් දෙකක් නම් කරන්න. (ලකුණු 5)